සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/20/පොදු | ඔබේ අංකය / உமது இல / Your No: ........ | දිනය / திகதி / Date: 2021.08.10 |

**සමෘද්ධි දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 8/2021**

ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශ ප්‍රධානීන්,
සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන්,
සමෘද්ධි කළමනාකරුවන්/සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු කාර්යය මණ්ඩලයේ සියළු දෙනා වෙත

**<u>ක්ෂේත්‍ර නිලධාරින් සඳහා ක්ෂේත්‍ර දීමනාව/අතිකාල හා දින වැටුප් ගෙවීම.</u>**

ආයතන සංග්‍රහයේ VIII වන පරිච්ඡේදයේ 04 වගන්තිය අනුව ක්ෂේත්‍ර නිලධාරියෙකු ලෙස අර්ථ දක්වා ඇත්තේ "ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර වැඩකටයුතු පැවරී ඇති එක් ස්ථානයකට සීමා නොවන යම් කාර්යාලයක සීමාවලින් පිටත පිහිටි වැඩබිම්වලට නිතිපතා යායුතු අධීක්ෂණ ස්වභාවයේ රාජකාරි පැවරී ඇති, පරීක්ෂණ, චාරිකා යනාදිය සිය රාජකාරියට ඇතුළත් නිලධාරියෙකු" යනුවෙනි.

එලෙස ක්ෂේත්‍ර දීමනාවක් සඳහා හිමිකම් ලබන මධ්‍යම රජයට අයත් තනතුරු යටතට මෙම දෙපාර්තමේන්තුවේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි කළමණාකරුවන් ක්ෂේත්‍ර නිලධාරින් ලෙස 2017.12.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 33/2017 හා 2018.11.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි ඇතුළත් කර ඇත.

ඉහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 33/2017 හි විධිවිධාන වලට අනුව එහි සඳහන් ක්ෂේත්‍ර දීමනාව හිමිවන්නේ "පූර්ණ කාලීනව ක්ෂේත්‍රගතව රාජකාරිවල නිරත නිලධාරීන් සඳහා" බව ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ EST-7/ALLOW/03/2014/2(තාව) හා 2021.06.22 දිනැති ලිපියෙන් දන්වා ඇත.

එමෙන්ම "ක්ෂේත්‍රයට නොගොස් පූර්ණකාලීනව කාර්යාලගතව සේවය කරන ලෙසට විධිමත්ව නියමකර ඇති ක්ෂේත්‍ර නිලධරයන්ට එම කාලසීමාව සඳහා සති අන්ත හෝ රජයේ නිවාඩු දිනවල සේවය කිරීම වෙනුවෙන් ආයතන සංග්‍රහයේ VIII වන පරිච්ඡේදයේ විධිවිධාන පරිදි අතිකාල හෝ නිවාඩු දින වැටුප් ගෙවිය හැකි බව" ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST-7/ALLOW/03/2014/2(තාව) හා 2021.06.30 දිනැති ලිපියෙන් දන්වා ඇත.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887 |
| | | Hot Line :0112-889007 | | | |

සමෘද්ධි අධිකාරිය යටතේ බඳවාගෙන ඇති මෙම සියළුම නිලධාරීන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අන්තර්ග්‍රහණය කිරීමේදි කාර්යාල කටයුතු සඳහා ප්‍රමාණවත් නිලධාරීන් පිරිසක් නොමැති බැවින් හා ක්ෂේත්‍රයට අතිරික්ත වන නිලධාරීන් පිරිසක් දෙපාර්තමේන්තුව තුළ සිටින බැවින්, සේවා අවශ්‍යතාවය මත සමෘද්ධි කළමනාකරුවන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් මෙන්ම සංවර්ධන නිලධාරීන් ද පූර්ණකාලීනව කාර්යාලගතව රාජකාරි කටයුතුවල සේවයේ යොදවා ඇත.

මේ පිළිබඳව ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දී ඇති උපදෙස් අනුව දෙපාර්තමේන්තුවේ පහත සඳහන් නිලධාරීන් සඳහා ක්ෂේත්‍ර දීමනා/ අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් ගෙවීම් පහත සඳහන් පරිදි සිදුකළ යුතුය.

01. සමෘද්ධි කළමනාකරු විශේෂ ශ්‍රේණිය හා MN-7 වැටුප් කේතය හිමි අනෙකුත් නිලධාරීන්

1.1 පූර්ණකාලීනව කාර්යාලගතව පමණක් සේවය කරනු ලබන නිලධාරීන් සඳහා සේවා අවශ්‍යතාවය මත රාජකාරි ඉටුකරනු ලබන සති අන්ත හා නිවාඩු දින සඳහා 1/20 දීමනාව

1.2 කාර්යාලගත කටයුතු හා ක්ෂේත්‍ර රාජකාරි කටයුතුවල නියැලෙන නිලධාරීන් සඳහා ක්ෂේත්‍ර දීමනාව

02. සම්බන්ධීකරණ නිලධාරි (MN-6) /සමෘද්ධි කළමනාකරු(MN-4) /සංවර්ධන නිලධාරි හා MN-4 වැටුප් කේතය හිමි අනෙකුත් සියළුම නිලධාරීන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන්

2.1 පූර්ණකාලීනව කාර්යාලගතව පමණක් සේවය කරනු ලබන නිලධාරීන් සඳහා සේවා අවශ්‍යතාවය මත සති අන්ත හා නිවාඩු දිනවල සේවය කිරීම වෙනුවෙන් ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ විධිවිධාන පරිදි අතිකාල / නිවාඩු දින වැටුප්

2.2 කාර්යාල රාජකාරි හා ක්ෂේත්‍ර රාජකාරි යන රාජකාරි කටයුතු දෙකෙහිම නියැලෙන නිලධාරීන් සඳහා ක්ෂේත්‍ර දීමනාව

ඉහත සඳහන් පරිදි එක් නිලධරයෙකු සඳහා ගෙවීම් කළහැකි වනුයේ ක්ෂේත්‍ර දීමනාව හෝ අතිකාල / නිවාඩු දින වැටුප් යන දෙකෙන් එක් දීමනාවක් සඳහා පමණක් වන අතර යම් නිලධරයෙකුගේ රාජකාරි ස්ථානය හෝ රාජකාරි ස්වභාවය වෙනස් වන්නේ නම් ඒ අනුව අදාළ දීමනාව ගෙවීම පිළිබඳ නිර්දේශය ඒ ඒ අංශ/ආයතන/දිස්ත්‍රික් භාර නිලධාරීන් වෙත පැවරේ.

මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන 2021 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වේ.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

| | | |
|---|---|---|
| 01. ලේකම්, සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |
| 02. විගණකාධිපති | - | කා.දැ.ගැ.ස. |
| 03. ආයතන අධ්‍යක්ෂ ජනරාල් | - | කා.දැ.ගැ.ස. |
| 04. ප්‍රධාන ගණකාධිකාරි | - | කා.දැ.ගැ.ස. |
| 05. ප්‍රධාන අභ්‍යන්තර විගණක | - | කා.දැ.ගැ.ස. |
| 06. සියළුම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගණකාධිකාරිවරුන් | - | දැ.ගැ.ස හා අ.ක.ස. |